# ඩෙල්ෆ්ට් ප්‍රාදේශීය සභාව

# යාපනය දිස්ත්‍රික්කය

-------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 අප්‍රේල් 05 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2010 අප්‍රේල් 19 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 1:2 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව ඩෙල්ෆ්ට් ප්‍රාදේශීය සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1:3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ඩෙල්ෆ්ට් ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතයවේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

#### 1:3:1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

--------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන වල හෙලිදරව් කර නොතිබුණි.

#### 1.3.2 ගණුම්කරණ අඩුපාඩු

------------------------

වත්කම් , වගකීම්, ආදායම හා වියදම් වලට අදාළව ගිණුම්වල නිරීක්ෂණය වූ ගිණුම්කරණ අඩුපාඩු අවස්ථා ගණන හා වටිනාකම යටතේ පහත වගුවෙහි දැක්වේ.

| | වත්කම් | | වගකීම් | | ආදායම | | වියදම | |
|---|---|---|---|---|---|---|---|---|
| | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනාකම |
| | | රු. | | රු. | | රු. | | රු. |
| (අ) ගිණුම්වල වැඩියෙන් දැක්වීම් | - | - | - | - | 01 | 1,200 | 01 | 62,762 |
| (ආ) ගිණුම්වල අඩුවෙන් දැක්වීම් | - | - | 02 | 1,431,914 | - | - | - | - |
| (ඇ) ගිණුම් වලින් අත්හැරීම් | 01 | 25,000 | - | - | - | - | - | - |

### 1.3.3 ගෙවිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.2,138,392 ක් විය.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

**විගණනය සඳහා තොරතුරු ඉදිරිපත් නොකිරීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා රු.1,011,681 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 1:3:5 අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ විධිවිධානවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ). 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 (අ) වගන්තිය | විෂය භාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගැනීමෙන් තොරව ආගමික හා පොදු වැඩ සඳහා වර්ෂයකට රු.1,000 ඉක්මවා වියදම් නොදැරිය යුතුය. එහෙත් අමාත්‍යවරයාගේ |

| | | |
|---|---|---|
| | | අනුමැතිය ලබා ගැනීමෙන් තොරව ආහාරපාන සඳහා රු.9,475 ක මුදලක් වියදම් දරා තිබුණි. |
| (ආ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 153 වගන්තිය | රු.16,706 ක් වු රඳවා ගැනීම් බදු අයකර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඇ) | 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදල් පනත | රු.2,150 ක් වු සේවක භාර කාර අරමුදලේ සභා දායකය ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඈ) | 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල පනත | තාවකාලික රියදුරෙකුට අදාළව රු.8,599 ක් වු සේවක අර්ථ සාධක දායකමුදල් හා රු.5,733 ක් වු සේවක භාරකාර දායමුදල් ප්‍රේෂණය කර නොතිබුණි. |

**(ඉ) උතුරු පළාත් සභාවේ මුදල් රෙගුලාසි**

| | |
|---|---|
| VI පරිච්ඡේදයේ 05 වගන්තියේ 237 උප වගන්තිය | රු.540 ක් වටිනාකම වු ඉදිරිපත් නොකළ චෙක්පතක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

(ඊ) ආයතන සංග්‍රහය

| | |
|---|---|
| VIII පරිච්ඡේදයේ 10 වගන්තිය | නිවාඩු දින ගෙවීම් ලිත් මාසයකට එක් දිනකට සීමා වුවද සභා ලේකම්වරයාට දින 10 ක නිවාඩු දින වැටුප් වශයෙන් රු.7,790 ක මුදලක් ගෙවා තිබුණි. |

## 2. මුල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මුල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවු ආදායම රු.1,069,922 ක් වු අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වු ආදායම රු.574,962 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 170 | 72 | - | 176 | 111 | - |
| බදු කුලී | 147 | 171 | 52 | 147 | 93 | 43 |
| බලපත්‍ර ගාස්තු | 26 | 63 | - | 28 | 22 | - |
| වෙනත් ආදායම් | 8,375 | 7,397 | - | 7,710 | 5,635 | - |

### 2:2:2 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් අනුව කයිට්ස් මහෙස්ත්‍රාත් අධිකරණය මගින් 2010 දෙසැම්බර් 31 දක්වා අයකර පළාත් ආදායම් කොමසාරිස්වරයාට ප්‍රේෂණය කරන ලද සමාලෝචිත වර්ෂයට හා පෙර වර්ෂ වලට අදාල දඩ මුදල සහ දඩ මුදල වලට අදාළ උපලේඛන සභාවට ලැබී නොතිබුණි.

### 2:2:3 මුද්දර ගාස්තු

2010 වර්ෂය සඳහා ලැබිය යුතු මුද්දර ගාස්තු ගණනය කර ගිණුම් ගත කර නොතිබුණි.

## 2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත සහ තථ්‍ය වියදම හා විචලනයන් පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 අයවැයගත | 2010 තථ්‍ය | 2010 විචලනය | 2009 අයවැයගත | 2009 තථ්‍ය | 2009 විචලනය |
|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| **පුනරාවර්තන වියදම** | | | | | | |
| පුද්ගල පඩිනඩි | 6,327 | 5,285 | 1,042 | 6,004 | 4,119 | 1,885 |
| වෙනත් | 2,368 | 1,349 | 1,019 | 2,008 | 1,167 | 841 |
| උප එකතුව | 8,695 | 6,634 | 2,061 | 8,012 | 5,286 | 2,726 |
| ප්‍රාග්ධන වියදම් | 10,300 | 2,905 | 7,395 | 5,150 | 2,833 | 2,317 |
| මුළු එකතුව | 18,995 | 9,539 | 9,456 | 13,162 | 8,119 | 5,043 |

## 2.4 මානව සම්පත් කළමනාකරණය

### 2.4.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික ශ්‍රේණි | - | - |
| ද්විතීයික ශ්‍රේණි | 06 | 04 |
| ප්‍රාථමික ශ්‍රේණි | 10 | 10 |
| වෙනත් ( අනියම් / තාවකාලික ) | - | 07 |
| එකතුව | 16 | 21 |

## 2.5 වත්කම් කළමනාකරණය

### 2.5.1 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ රු.399,269 ක් වූ අතර වර්ෂ 1 කට වැඩි කාලයක් ඉක්මවූ ලැබිය යුතු ගිණුම් ශේෂ රු.199,215 ක් විය.

### 2.5.2 අධිකාර් බලය නොලත් ගණුදෙනු

රු.135,000 ක් වු පෙර පාසැල් ගුරුවරුන්ගේ වැටුප් හා රු.9,010 ක් වු "NELSIP" ව්‍යාපෘති වැඩ සඳහා ගෙවීම් වෙනුවෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 (අ) වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයාගේ පුර්ව ලඛිත අනුමැතිය ලබාගෙන නොතිබුණි.

### 2.5.3 කාර්ය සාධනය

ගිණුම් වර්ෂය ආරම්භයේදී සභාව විසින් වාර්ෂික ක්‍රියාකාර් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. එබැවින් ඉටුකරගත යුතු අපේක්ෂිත ඉලක්ක හා ඒ පිළිබඳ ප්‍රගතිය තහවුරු කළ නොහැකි විය.

### 2.6 අභ්‍යන්තර විගණනය

ප්‍රාදේශීය සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ). ගිණුම්කරණය

(ආ) ආදායම් පර්පාලනය

(ඇ). වත්කම් කළමනාකරණය

(ඈ). මෝටර් වාහන පාලනය

(ඉ) ආපසු ගෙවිය යුතු තැන්පතු